සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරනම්මන විසින් සියල්ල ලියා සහතික කරන ලද වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 30 දිනැති අංක 3388, 2016 ජනවාරි මස 19 දිනැති 3401, 2018 සැප්තැම්බර් මස 13 වැනි දිනැති 5028 දරන බැඳුම්කරයන් මගින් උකස්කොට ඇපකොට තබාගෙන ලබාදුන් ණය මුදල සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ චම්කා මෝටර් සර්විස් යන නාමය අභිධානය යටතේ තනි ස්වාමීත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන ක්‍රිෂාන්ත සේරසිංහ යන අය "බැඳීම් දරන්නා" විසින් PQ 144 දරන සමාගම් ලියාපදිංචි අංකය දරන සහ අංක 110, ශ්‍රී ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02 යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි "Sampath Bank PLC Holding" වෙත පහත දැක්වෙන උපලේඛනවල විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ඇපකර ලෙස තබා ගනිමින් ලබාගත් ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැර ඇති බැවින් ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයේ සුරැකුම මත පිරිනමන ලද ණය පහසුකම් ආපසු ගෙවීමේ දී පැහැර හැරීම් සිදුකර ඇති හෙයින්, සහ එකී උකස් බැඳුම්කර මත 2026 ජූලි මස 16 වැනි දිනට අයවීමට ඇති මුළු මුදල සහ පොළිය වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දස මිලියන හාර ලක්ෂ අනූ එක් දහස් හාරසිය පහයි ශත හැට අටක මුදලක් (රු. 1,04,91,405.68) ද සමග ඉහත කී සම්පත් බැන්ක් පී. එල්. සී. වෙත අංක 3388, 3401 සහ 5028 දරන එකී උකස් බැඳුම්කරයන් මත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද ඉහත කී සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ එකී රුපියල් දස මිලියන හාර ලක්ෂ අනූ එක් දහස් හාරසිය පහයි ශත හැට අටක (රු. 1,04,91,405.68)ක එකී මුදල ද සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 ජූලි මස 17 වැනි දින සිට වාර්ෂිකව සියයට නවයයි බිංදුවක් (9.0%) බැගින් රුපියල් හත් මිලියන හාරලක්ෂ හතළිස් තුන් දහස් අටසිය විසි දෙකයි ශත දහසයක (රු. 7,443,822.16) මුදල මත වැඩිදුර පොළිය ද, ප්‍රවාරණ පිරිවැය සහ අනෙක් උද්ගත වූ ගාස්තු ද සමග ඉන් අනතුරුව ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා අංක 3388, 3401 සහ 5028 දරන එකී උකස් බැඳුම්කරයන් මගින් එකී ණය පහසුකම සඳහා සුරැකුම් වශයෙන් ඉහත කී සම්පත් බැන්ක් පී.එල්. සී. වෙත උකස් කළ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර වන දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. ජී. සී. ප්‍රියදර්ශනී විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගංගබොඩ පත්තුවේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටකටුවාන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, පිටකටුවාන පිහිටි "මහදෙනිය කුඹුරෙහි ලොට් 2හි අනු බෙදීමක් වන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජී. විමලරත්න විසින් සකස් කළ 2007.05.21 දිනැති අංක 1686 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 2A වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරු නැගෙනහිරට : මහගදෙනිය ගොඩැල්ල; දකුණු නැගෙනහිරට : මිරිස්වත්ත ගෙපලහේන, ඇල සඳහා වෙන්කිරීම ද; දකුණු බටහිරට : මෙම ඉඩමේම ලොට් 2B ද සහ උතුරු බටහිරට: කඩිවුව සිට කඹුරුපිටිය දක්වා දිවෙන ප්‍රධාන පාර ද මායිම් තුළ පිහිටි 1686 පිඹුර ප්‍රකාරව පර්චස් නිස් පහයි දශම තුනයි නවයක් (අ.0, රූ.0, පර්.35.39) ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 15/140 යොමුව යටතේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3388 යටතේ උකස් කොට ඇපයට තබා ඇති දේපළ)

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගංගබොඩ පත්තුවේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, පිටකටුවාන පිහිටි "මිරිස්වත්ත කුට්ටිය හි ලොට් 19 හි ලොට් 3හි අනු බෙදීමක් වන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජී. විමලරත්න විසින් සකස් කළ 2015.11.27 දිනැති අංක 3609A දරන පිඹුරේ නිරූපිත ලොට් 3A වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේම ලොට් 4 ද; නැගෙනහිරට : නිවෙස් දක්වා දිවෙන මිරිස්වත්ත කඹුරුපිටිය ප්‍රධාන මාර්ගය ද; දකුණට : මෙම ඉඩමේම ලොට් 3B, 3C සහ ලොට් 2 ද සහ බටහිරට : ප්‍රාදේශීය සභා පාර ද මායිම් තුළ පිහිටි 3609A පිඹුර ප්‍රකාරව පර්චස් තිස් එකයි දශම හතරයි අටක් (අ.0, රූ.0, පර්. 31.48ක) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 76/98 යොමුව යටතේ ලියාපදිංචි කොට ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගංගබොඩ පත්තුවේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, පිටකටුවාන පිහිටි "මිරිස්වත්ත කුට්ටිය හි ලොට් 19 හි ලොට් 3හි අනු බෙදීමක් වන" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජී. විමලරත්න විසින් සකස් කළ 2015.11.27 දිනැති අංක 3609A දරන පිඹුරේ නිරූපිත ලොට් 3B වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේම ලොට් 3A ද; නැගෙනහිරට : නිවෙස් දක්වා දිවෙන මිරිස්වත්ත කඹුරුපිටිය ප්‍රධාන මාර්ගය ද; දකුණට : මිරිස්වත්ත කඹුරුපිටිය ප්‍රධාන මාර්ගය ද සහ ලොට් 2 ද සහ බටහිරට : මෙම ඉඩමේම ලොට් 3 3C මායිම් තුළ පිහිටි 3609A පිඹුර ප්‍රකාරව පර්චස් විසි තුනයි දශම විස්සක් (අ.0, රූ.0, පර්. 23.20ක) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 76/99 යොමුව යටතේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3401 සහ 5028 යටතේ උකස් කොට ඇපයට තබා ඇති දේපළ).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 837

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.09.12 වන දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී:

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්.ඒ.ඩී.එස්.කේ. අතුකෝරල විසින් සහතික කරන ලද 2024.08.30 දිනැති අංක 3875 දරන උකස් බැඳුම්කරය හා ප්‍රසිද්ධ නොතාරිස් එස්.ඒ.ඩී.එස්.කේ. අතුකෝරල විසින් සහතික කරන ලද 2024.12.13 දිනැති අංක 3961 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2026.07.09 වන දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 19,561,144.29ක (රුපියල් එක්කෝටි අනූපන්ලක්ෂ හැටඑක්දහස් එකසිය හතළිස් හතරයි ශත විසිනවයක් පමණි) මුදලක් හා රු.18,504,647.96ක (එක්කෝටි අසූපන් ලක්ෂ හාරදහස් හයසිය හතළිස් හතයි ශත අනූහයක් පමණි) මුදල මත 2026.07.10 වන දින සිට ණය මුදල ගෙවා අවසන් කරන දිනය දක්වා වාර්ෂිකව සියයට දහතුන (13%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, **2 වන ණය** මත 2026.07.09 වන දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,213,980.03ක (රුපියල් අනූදෙලක්ෂ දහතුන් දහස් නවසිය අසූවයි ශත තුනක් පමණි) මුදලක් හා රු. 8,771,236.98ක (අසූහත් ලක්ෂ හැත්තෑඑක්දහස් දෙසියතිස් හයයි ශත අනූඅටක් පමණි) මුදල මත 2026.07.10 වන දින සිට ණය මුදල ගෙවා අවසන් කරන දිනය දක්වා වාර්ෂිකව සියයට දහතුන (13%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, කෑගල්ල, ඇනස්ලි පීරිස් මාවත, අංක 22/2 හි පදිංචි විදානලාගේ දුලිප් ප්‍රසංග මහතාගෙන් බැංකුවට අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් එස්.ඒ.ඩී.එස්.කේ. අතුකෝරල විසින් සහතික කරන ලද 2024.08.30 දිනැති අංක 3875 දරන එකී උකස් බැඳුම්කරය හා ප්‍රසිද්ධ නොතාරිස් එස්.ඒ.ඩී.එස්.කේ. අතුකෝරල විසින් සහතික කරන ලද 2024.12.13 දිනැති අංක 3961 දරන එකී උකස් බැඳුම්කරය යටතේ **1 වන ණය** මත රු. 19,561,144.29ක (රුපියල් එක්කෝටි අනූපන්ලක්ෂ හැටඑක්දහස් එකසිය හතළිස් හතරයි ශත විසිනවයක් පමණි) එකී මුදල ද, **2 වන ණය** මත රු. 9,213,980.03ක (රුපියල් අනූදෙලක්ෂ දහතුන් දහස් නවසිය අසූවයි ශත තුනක් පමණි) එකී මුදල ද, 2026.07.10 වන දින සිට විකුණනු ලබන දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අය විය යුතු ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයන් හි විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පිහිටා ඇති "ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම" වෙන්දේසිකාර ආයතනයට ලංකා බැංකු

ආඥාපනතේ 19 වන වගන්තිය (397 වන අධිකාරය) සහ එහි සංශෝධන යටතේ ද, එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළකිරීම සඳහා ලංකා බැංකුවේ කෑගල්ල අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළේ, දැයලදහමුන පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කෑගල්ල නගර සභා සීමාව තුළ මීපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මීපිටිය ග්‍රාමයේ පිහිටා ඇති ඇනස්ලි පීරිස් මාවතේ වරිපනම් අංක 22/2 දරන "අඳගොල්ලෙවත්තේ මූකලාන (T.P.153514හි කොටසක්)" නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු පී. ඉන්ද්‍රානි මල්ලිකා විසින් සාදන ලද 2018.07.19 වන දිනැති අංක 4416/A දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් 01 ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 01; ඊසානට බලයලත් මිනින්දෝරු ජී.එස්. ගලගෙදර විසින් සාදන ලද අංක 8400 පිඹුරේ ලොට් 3 ද, ගිණිකොණට : මාර්ග වෙන්කිරීම ද; නිරිතට : බලයලත් මිනින්දෝරු ජී.එස්. ගලගෙදර විසින් සාදන ලද අංක 8400 පිඹුරේ ලොට් 01 සහ වයඹට : ඉකිලියද්දේ කුඹුර ද මායිම්ව අංක 4416/A දරන එකී පිඹුර අනුව පර්චස් දොළහක (අ.00-, රූ.00-, පර්.12) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පස හා සියලු දේ සමඟ වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ අංක D 346/131 දරන සටහන් තීරුවේ ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 01 පහත දැක්වෙන ඉඩමේ නැවත මැනුමකි :

ඉහත කී මීපිටිය ග්‍රාමයේ පිහිටා ඇති ඇනස්ලි පීරිස් මාවතේ, වරිපනම් අංක 22/2 දරන "අඳගොල්ලෙවත්තේ මූකලාන (T.P.153514හි කොටසක්)" නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු ජී.එස්. ගලගෙදර විසින් සාදන ලද 2007.02.18 හා 2007.08.08 වන දිනැති අංක 8400 දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් 02 ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 02; ඊසානට : මෙහි ලොට් 03 ද; ගිණිකොණට : පාර ද; නිරිතට : මෙහි ලොට් 01 සහ වයඹට : ඉකිලියද්දේ කුඹුර ද; මායිම්ව පර්චස් දොළහක (අ.00-, රූ.00-, පර්.12) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පස හා සියලු දේ සමඟ වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ අංක D 346/130 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී 2018.07.19 දිනැති අංක 4416/A දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි, සලකුණු කර ඇති ස්ථාන මතින් හා ඒ දිගේ ගමන් අයිනිය (හෝ මාර්ග අයිනිය) සමඟ**ිනි.**

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී.ඩී.ජේ.එන්. වික්‍රමසිංහ මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

2026 සැප්තැම්බර් මස 25 වැනි දින.
ලංකා බැංකුව,
කෑගල්ල අධිශ්‍රේණි ශාඛාව.

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.08.14 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී:

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ.එම්.ආර්.එන්.එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 2020.09.24 දිනැති අංක 1864 දරන උකස් බැඳුම්කරය හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්.එල්. පී. රණසිංහ විසින් සහතික කරන ලද 2023.10.27 දිනැති 59 දරන උකස් බැඳුම්කරය අනුව **ප්‍රතිව්‍යුහගත 'A' ණය** මත 2026.06.17 වන දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 30,308,420.94ක (තුන්කෝටි තුන්ලක්ෂ අටදහස් හාරසිය විස්සයි ශත අනූහතරක) මුදලක් හා රු. 20,869,000.00ක (දෙකෝටි අටලක්ෂ හැටනවදහසක) මුදල මත 2026.06.18 වන දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට දහඅට (18.00%) බැගින් වූ පොලී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, **ප්‍රතිව්‍යුහගත 'B' ණය** මත 2026.06.17 වන දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 6,362,530.08ක (හැටතුන්ලක්ෂ හැටදෙදහස් පන්සිය තිහයි ශත අටක) මුදලක් හා රු. 5,727,000.00ක (පනස් හත්ලක්ෂ විසිහත් දහසක) මුදල මත 2026.06.18 වන දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට හතර (4.00%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, දඹදෙණිය, බෝගොඩ හි බෝගොඩ කන්ස්ට්‍රක්ශන් වෙතින් බැංකුවට අයවිය යුතුව ඇත. (තනි අයිතිකරු - කන්නිමි මුදියන්සේලාගේ වන්දන ප්‍රියශාන්ත බෝගොඩ මහතා හෙවත් කන්නිමි මුදියන්සේලාගේ වන්දන ප්‍රියශාන්ත බෝගොඩ)

2. 2020.09.24 දිනැති අංක 1864 දරන එකී උකස් බැඳුම්කරය හා 2023.10.27 දිනැති 59 දරන එකී උකස් බැඳුම්කරය යටතේ **ප්‍රතිව්‍යුහගත 'A' ණය** මත රු. 30,308,420.94ක (තුන්කෝටි තුන්ලක්ෂ අටදහස් හාරසිය විස්සයි ශත අනූහතරක) එකී මුදල ද, **ප්‍රතිව්‍යුහගත 'B' ණය** ණය මත රු. 6,362,530.08ක (හැටතුන්ලක්ෂ හැටදෙදහස් පන්සිය තිහයි ශත අටක) එකී මුදල ද, 2026.06.18 වන දින සිට විකුණනු ලබන දිනය තෙක් ඉහත කී පරිදි පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අය විය යුතු ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මුදුගමුවේ හේවාවසම් තුසිත් කරුණාරත්න මහතාට ලංකා බැංකු ආඥාපනතේ 19 වන වගන්තිය (397 වන අධිකාරය) සහ එහි සංශෝධන යටතේ ද, එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ

මෙම යෝජනාවේ දැන්වීම් පළකිරීම සඳහා ලංකා බැංකුවේ ගිරිඋල්ල ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩුකහ කෝරළේ, නාරම්මල ප්‍රාදේශීය සභා සීමාව තුළ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1038-අතුරුවල ග්‍රාමය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උඩියවල ග්‍රාමයේ පිහිටා ඇති "වදුරුස්සේහේන වර්තමානයේ වත්ත" නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු එල්.ඩබ්ලිව්.අයි. ජයසේකර විසින් සාදන ලද 2018.02.12 දිනැති අංක 3440/18 දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් 3 ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 3;

උතුරට	: ලොට් 02 (අඩි 25ක් පළල පොදු මාර්ගය) හා ලොට් 1 ද;
නැගෙනහිරට	: එම්.ඒ. පියසේන හා වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම (Lot 1^{Q} in F.V.P. 557) ද;
දකුණට	: රංජන් විජේසිංහ විසින් හිමිකම් කියන ඉඩම (Lot 1^{T} and Lot 1^{S} in F.V.P. 557) ද;
බස්නාහිරට	: ගිරිඋල්ල සිට කුරුණෑගල දක්වා මාර්ගය (මා.සං.අධි.) ද;

මායිම්ව රූඩ් තුනයි පර්චස් තිස් හතක (අ.00-රූ.03-පර්.37) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වැවිලි, ගොඩනැගිලි හා සියලු දේ සමඟ වේ. මෙය නාරම්මල ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ Y 52/07 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ඊ. ඒ. ඒ. සංජීව මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
ගිරිඋල්ල ශාඛාව.

10 - 835

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2024 ජනවාරි 08 දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් සහතික කරන ලද 2015.01.16 දිනැති අංක 2752 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය පහසුකම මත 2023.12.14 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 897,473.95 ක (රුපියල් අට ලක්ෂ අනූහත් දහස් හාරසිය හැත්තෑතුනයි ශත අනූපහක) මුදලක් සමඟ මුල් මුදලේ ශේෂය රු. 507,002.00 (රුපියල් පන් ලක්ෂ හත් දහස් දෙකක්) මත වසරකට සියයට දහඅටයි දශම නවයයි හයක් (18.96%) බැගින් 2023.12.15 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද; 2 වන ණය පහසුකම මත 2023.12.14 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 13,329,369,99 ක (රුපියල් එක්කෝටි තිස්තුන් ලක්ෂ විසිනව දහස් තුන්සිය හැටනවයයි ශත අනූනවයක) මුදලක් සමඟ මුල් මුදලේ ශේෂය රු. 7,066,662.00 (රුපියල් මිලියන හතයි හැටහය දහස් හයසිය හැටදෙකක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.12.15 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, පොලොන්නරුව, 28 වන කණුව, ගජබා පටුමග, අංක 537/2 හි මහගෙදර හේනයලාගේ සුසිල් කුමාර මහතා සහ විදාන හේනයලෑගේ කමලාවති හෙවත් විදානේහේලෑගේ කමලාවති මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් සහතික කරන ලද 2015.01.16 දිනැති අංක 2752 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය පහසුකම මත රු. 897,473,95 ක (රුපියල් අට ලක්ෂ අනූහත් දහස් හාරසිය හැත්තෑතුනයි ශත අනූපහක) මුදලක් ද 2 වන ණය පහසුකම මත රු. 13,329,369.99 ක (රුපියල් එක්කෝටි තිස්තුන් ලක්ෂ විසිනව දහස් තුන්සිය හැටනවයයි ශත අනූනවයක) මුදලක් ද 2023.12.15 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් එකී පරිදි පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත පළමු වන උපලේඛනයේ විස්තර කොට ඇති දේපල දෙවන උපලේඛනයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට යටත්ව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, T&H ඔක්ෂන් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, කදුරුවල අධිශ්‍රේණි ශාඛාවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකාර මහතා හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

පළමුවන උපලේඛනය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා ප්‍රාදේශීය සභා සීමාවේ මැදපත්තුව හි මහසෙන් පෙදෙස, අංක 180 දරන ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ, පළුගස්දමන ග්‍රාමයේ පිහිටි "ස්ටේට් ලෑන්ඩ්" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී.බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2011.09.24 දිනැති අංක 2011/පො/157 හි මායිම් නිරූපනය කළ ලොට් අංක 01 ලෙස ලකුණු

කළ බෙදනලද්දා වූ එකී ලොට් 01 උතුරට : අංක 2006/පෝ/192 හි ලොට් අංක 01 සහ එෆ්.සී.පී.පෝ 18 හි ලොට් අංක 54 සහ 114 ද; නැගෙනහිරට : එෆ්.සී.පී.පෝ. 18 හි ලොට් අංක 114 සහ 117 ද; දකුණට : එෆ්.සී.පී.පෝ. 18 හි ලොට් අංක 117, 108 සහ 116 සහ අංක 2006/පෝ/192 හි ලොට් අංක 01 ද; බස්නාහිරට: අංක 2006/පෝ/192 හි ලොට් අංක 01 ද මායිම්ව හෙක්ටෙයාර බිංදුවයි දශම බිංදුවයි හයයි නවයයි දෙකක් (හෙක්. 0.0692) ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහ කොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O. B/15/46 හි ලියාපදිංචි කර ඇත.

පළමුවන උපලේඛනය

වෙන්කිරීම් :

1. සියලු ඛනිජ (ඔප්පුවේ මෙම යෙදුමට වටිනා ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම සහ ඒවා හැරීම සෙවීම ඒ සම්බන්ධව වැඩ කිරීම සහ එවැනි ඛනිජ බැහැරකිරීම යනාදි අයිතීන් රජය සතුය.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම වන්නේ මෙම ප්‍රදානයේ දිනයේ සිට පාරේ අයිතිය හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටත්වයි.

කොන්දේසි :

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් මෙහි නිශ්චිතව දක්වා ඇති හෙක්ටෙයාර 0.025ක් මඩ ඉඩමෙන් අක්කර 1/4 කට වඩා අඩු උප බෙදුම් ඒකකයක් බැහැර නොකළ යුතුය

2. අයිතිකරු විසින් මෙහි අක්කර 1/4 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

3. කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසකට අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු අවම නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරි මාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හැරීම සෙවීම භාවිතයට ගැනීම විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම අයිතිකරු විසින් නොකළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතු ය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. පී. එස්. හේරත්,
ජ්‍යෙෂ්ඨ කළමණාකරු.

ලංකා බැංකුව,
කඳුරුවෙල අධිශ්‍රේණි ශාඛාව.

සටහන - පළමු ණය පහසුකම පොළී සහනයක් සහිතව 2024.12.06 වන දින ණයකරු විසින් එකවර ගෙවා අවසන් කර ඇත.

10 - 832

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2026 සැප්තැම්බර් 12 දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමනිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදි.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්.ඩී.එස්.කේ. නරසිංහ විසින් සහතික කරන ලද 2018.10.26 දිනැති අංක 150 දරන උකස් බැඳුම්කරය අනුව ප්‍රතිලේඛනගත ණය A මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 133,283,315.80ක (රුපියල් මිලියන එකසිය තිස්තුනයි දෙසිය අසූතුන් දහස් තුන්සිය පහළොවයි ශත අසූවක්) මුදලක් සමග මුල් මුදලේ ශේෂය රු. 63,092,632.00 (රුපියල් මිලියන හැටතුනයි අනූදෙදහස් හයසිය තිස්දෙකක්) මත වසරකට සියයට දහහතරයි දශම අටයි හතරක් (14.84%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, ප්‍රතිලේඛනගත ණය B මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 5,494,522.31 ක (රුපියල් මිලියන පහයි හාරසිය අනූ හතරදහස් පන්සිය විසිදෙකයි ශත තිස්එකක්) මුදලක් සමග මුල් මුදලේ ශේෂය රු. 3,750,512.98ක (රුපියල් මිලියන තුනයි හත්සිය පනස් දහස් පන්සිය දොළහයි ශත අනූඅටක්) මුදලක් මත වසරකට සියයට හයක් (6%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද කාලීන ණය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 16,997,139.91 ක (රුපියල් මිලියන දහසයයි නවසිය අනූහත් දහස් එකසිය තිස්නවයයි ශත අනූඑකක්) මුදලක් සමග මුල් මුදලේ ශේෂය

රු. 8,234,348.21ක (රුපියල් මිලියන අටයි දෙසිය තිස්හතර දහස් තුන්සිය හතලිස් අටයි ශත විසිඑකක්) මුදලක් මත වසරකට සියයට දහහතරයි දශම අටයි හතරක් (14.84%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 01 වැනි බැංකු ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 3,558,673.97 ක (රුපියල් මිලියන තුනයි පන්සිය පනස්අට දහස් හයසිය හැත්තෑ තුනයි ශත අනූ හතක්) මුදලක් සමග රු.1,800,000.00ක (රුපියල් මිලියන එකයි අටසිය දහසක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද 02 වැනි බැංකු ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,094,389.04 ක (රුපියල් මිලියන නවයයි අනූහතර දහස් තුන්සිය අසූ නවයයි ශත හතරක්) මුදලක් සමග රු. 4,600,000.00ක (රුපියල් මිලියන හතරයි හයසිය දහසක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද 03 වැනි බැංකු ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,885,205.48 ක (රුපියල් මිලියන නවයයි අටසිය අසූපන්දහස් දෙසිය පහයි ශත හතලිස් අටක්) මුදලක් සමග රු. 5,000,000.00ක (රුපියල් මිලියන පහක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද 04 වැනි බැංකු ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 2,573,161.64 ක (රුපියල් මිලියන දෙකයි පන්සිය හැත්තෑ තුන්දහස් එකසිය හැටඑකයි ශත හැට හතරක්) මුදලක් සමග රු. 1,400,000.00ක (රුපියල් මිලියන එකයි හාරසිය දහසක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද "NL Distributors" සහ "Singhe Traders" යන නමින් හා විලාසයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යන හවුල් ව්‍යාපාර වෙත ලබාදුන් ඇපකර පහසුකම් ද මහනුවර සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 640/09 හි දොන් චන්ද්‍රසේකර අමරසිංහ *හෙවත්* අමරසිංහ ආරච්චිගේ දොන් චන්ද්‍රසේකර අමරසිංහ මහතා (මියගිය), මහනුවර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 640/09 හි ජයසිංහ ආරච්චිගේ මංගලිකා ජයසිංහ මහත්මිය සහ මහනුවර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 640/09 හි අමරසිංහ ආරච්චිගේ නුවන් පුබුදු අමරසිංහ මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්.ඩී.එස්.කේ. නරසිංහ විසින් සහතික කරන ලද 2018.10.26 දිනැති අංක 150 දරන උකස් බැඳුම්කරය අනුව ප්‍රතිලේඛනගත A මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 133,283,315.80 (රුපියල් මිලියන එකසිය තිස්තුනයි දෙසිය අසූතුන් දහස් තුන්සිය පහළොවයි ශත අසූව) ක මුදලක් සමග මුල් මුදලේ ශේෂය රු. 63,092,632.00 (රුපියල් මිලියන හැටතුනයි අනූදෙදහස් හයසිය තිස්දෙකක්) මත වසරකට සියයට දහහතරයි දශම අටයි හතරක් (14.84%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, ප්‍රතිලේඛනගත ණය B මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 5,494,522.31 ක (රුපියල් මිලියන පහයි හාරසිය අනූ හතරදහස් පන්සිය විසිදෙකයි ශත තිස්එකක්) මුදලක් සමග මුල් මුදලේ ශේෂය රු. 3,750,512.98ක (රුපියල් මිලියන තුනයි හත්සිය පනස් දහස් පන්සිය දොළහයි ශත අනූඅටක්) මුදලක් මත වසරකට සියයට හයක් (6%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, කාලීන ණය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු.16,997,139.91 ක (රුපියල් මිලියන දහසයයි නවසිය අනූහත් දහස් එකසිය තිස්නවයයි ශත අනූ එකක්) මුදලක් සමග මුල් මුදලේ ශේෂය රු. 8,234,348.21ක (රුපියල් මිලියන අටයි දෙසිය තිස්හතර දහස් තුන්සිය හතලිස් අටයි ශත විසිඑකක්) මුදලක් මත වසරකට සියයට දහහතරයි දශම අටයි හතරක් (14.84%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, 01 වැනි ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 3,558,673.97 ක (රුපියල් මිලියන තුනයි පන්සිය පනස්අට දහස් හයසිය හැත්තෑ තුනයි ශත අනූ හතක්) මුදලක් සමග රු. 1,800,000.00ක (රුපියල් මිලියන එකයි අටසිය දහසක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, 02 වැනි ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,094,389.04 ක (රුපියල් මිලියන නවයයි අනූහතර දහස් තුන්සිය අසූ නවයයි ශත හතරක්) මුදලක් සමග රු. 4,600,000.00ක (රුපියල් මිලියන හතරයි හයසිය දහසක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, 03 වැනි ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 9,885,205.48 ක (රුපියල් මිලියන නවයයි අටසිය අසූපන්දහස් දෙසිය පහයි ශත හතලිස් අටක්) මුදලක් සමග රු. 5,000,000.00ක (රුපියල් මිලියන පහක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, 04 වැනි ඇපකරය මත 2026.07.31 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 2,573,161.64 ක (රුපියල් මිලියන දෙකයි පන්සිය හැත්තෑ තුන්දහස් එකසිය හැටඑකයි ශත හැට හතරක්) මුදලක් සමග රු.1,400,000.00ක (රුපියල් මිලියන එකයි හාරසිය දහසක්) මුදලක් මත වසරකට සියයට විසිහයක් (26.00%) බැගින් 2026.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 T&H ඔක්ෂන්හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ බකමූණ ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

පළමුවන උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ,

ගඟවට කෝරළයේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශයේ, වෝඩ් අංක 2 වලාට හි පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 2010 පෙබරවාරි මස 22 දිනැති අංක 4952 දරන පිඹුරේ මායිම් නිරූපනය කර ලොට් අංක 01 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 01 උතුරට : අංක 919 දරන පිඹුරේ ලොට් 03 ද; නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් අංක 2 ද; දකුණට : අංක 919 දරන පිඹුරේ ලොට් B 2 ද; බස්නාහිරට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 652/2 දරන පරිශ්‍රය ද මායිම්ව රූඩ් එකයි පර්චස් තුනක් (අ.ඕ.,රූ.1.,පර්.3.00) හෝ හෙක්ටෙයාර බිංදුවයි දශම එකයි බිංදුවයි අටයි හතයි හයක් (හෙක්ටෙයාර 0.10876) ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහ කොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ.මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A588/35 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, ගඟවට කෝරළයේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශයේ, වලාට හි පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 2010 පෙබරවාරි මස 22 දිනැති අංක 4952 දරන පිඹුරේ මායිම් නිරූපනය කර ලොට් අංක 02 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 02, උතුරට : අංක 919 දරන පිඹුරේ ලොට් B 3 ද; නැගෙනහිරට: සිරිමාවෝ බණ්ඩාරනායක මාවත වරිපනම් අංක 664 හා 664/1 දරන පරිශ්‍රය ද; දකුණට : අංක 919 දරන පිඹුරේ X-Y-Z ලෙස ලකුණු කළ ධාවන පථය සහ අඩි 15 ක් පළල Z-Z1, මාර්ගය ද; බස්නාහිරට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 652/2 සහ අංක 4952 දරන පිඹුරේ ලොට් අංක 1 මායිම්ව පර්චස් අටක් (අ.ඕ., රූ.0., පර්.8.00) හෝ හෙක්ටෙයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි බිංදුවයි දෙකක් (හෙක්ටෙයාර 0.0202) ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහ කොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 660/115 හි ලියාපදිංචි කර ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, ගඟවට කෝරළයේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශයේ වලාට හි පිහිටි "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 2010 පෙබරවාරි මස 22 දිනැති අංක 4952 දරන පිඹුරේ මායිම් නිරූපනය කර ලොට් අංක 03 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 03, උතුරට : මාබල් කුරේ මාවත ද; නැගෙනහිරට: සිරිමාවෝ බණ්ඩාරනායක මාවත වරිපනම් අංක 642/2 දරන පරිශ්‍රය ද; දකුණට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත වරිපනම් අංක 664 සහ 644/1 දරන පරිශ්‍ර ද; බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 2 සහ අංක 919 දරන පිඹුරේ ලොට් B 3 ද මායිම්ව රූඩ් එකයි පර්චස් එකයි දශම අටයි හතක් (අ.ඕ.,රූ.1.,පර්.1.87) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහ කොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 660/116 හි ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළයේ, ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා මහනුවර මහ නගර සභා සීමාවේ, වලාට ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශයේ, පේරාදෙනිය පාරේ, වර්තමානයේ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පිහිටි, "තලඋයන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සී. පාලම්කුඹුර විසින් සාදන ලද 1980 අගෝස්තු මස 14 දිනැති අංක 919 දරන පිඹුරේ X-Y-Z-Z1 ලෙස මායිම් නිරූපනය කළ අඩි 15 ක් පළල ප්‍රවේශ මාර්ගය, උතුරට : එකී පිඹුරේ ලොට් B1 සහ ලොට් B2 සහ ලොට් C ද; නැගෙනහිරට: එකී පිඹුරේ වරිපනම් අංක 644 දරන පරිශ්‍රය, එකී පිඹුරේ ලොට් B 2 සහ ලොට් C ද; දකුණට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, එකී පිඹුරේ ලොට් B 2 සහ ලොට් C ද; බස්නාහිරට : ලොට් C සහ B 2 ද මායිම්ව පර්චස් විසිහතරයි දශම දෙකයි පහක් (අ.ඕ., රූ.0., පර්. 24.25) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 452/130 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. පී. එස්. පතිරණ මහතා
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
බකමූණ ශාඛාව.

10 - 833

සම්පත් බැංකුව පී.එල්.සී.
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එස්. කේ. අබේසූරිය
ගිණුම් අංකය : 1022 5472 7607

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.09.30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. එම්. ඩී. කිත්සිරි විසින් ලියා සහතික කරන ලද 2021 මාර්තු මස 29 දිනැති හා අංක 3910 සහ 2025 ඔක්තෝබර් මස 15 දිනැති 4804 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට

මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබා දුන් ණය පහසුකම් ආපසු ගෙවීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුසන්ත කුමාර අබේසූරිය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3910 හා 4804 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොළොස් මිලියන හතළිස් නව දහස් දෙසිය විස්සයි ශත හතළිස් එකක් (රු. 11,049,220.41) මුදලක්, 2026 අගෝස්තු මස 23 වැනි දිනට එකී සම්පත් බැංකුව පිළිල්සී වෙත ලැබිය යුතුව ඇති හෙයින් ද, එම මුදල් පියවනු ලබන දිනය තෙක් රුපියල් දස මිලියන අටලක්ෂ හතළිස් අටදහස් පන්සිය හැට නවයයි ශත හැත්තෑ දෙකක් (රු. 10,848,569.72) මුදලක් සඳහා වාර්ෂිකව දහයයි දශම බිංදුවක් (10.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 3910 සහ 4804 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පිළිල්සී වෙත උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පිළිල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, සීතාවකපුර නගර සභා සීමාව තුළ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 432D දරන කොටහැර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රත්නපුර පාරේ පිහිටි, වරිපනම් අංක 20 දරන "කොටබොඩවත්ත" යයි කියනු ලබන ඉඩමට, බලයලත් මානක තැන ආර්. ඒ. ඩී. එල්. විජයවර්ධන විසින් සාදන ලද 2020 අගෝස්තු මස 23 දාතම හා අංක 2616A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: අංක 189 දරන පිඹුරේ ලොට් 3; නැගෙනහිරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) - රත්නපුර පාර; දකුණට : අංක 189 දරන පිඹුරේ ලොට් 5 හි කොටසක්; බස්නාහිරට : අංක 189 දරන පිඹුරේ ලොට් 5 හි කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම තුනයි දෙකයි එකක් (A.0 - R.0 - P.3.321) විශාල ඉඩම් කොටස සමග එහි පස, ගහකොළ සහ ඒ මත ඇති අනෙකුත් සියලු දේ සමග එකී අංක 2616A දරන පිඹුරට අනුව වේ.

එකී A ලෙස ලකුණු කොට ඇති ඉඩම් කොටස, පහත මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත සමීක්ෂණයක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, සීතාවකපුර නගර සභා සීමාව තුළ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 432D දරන කොටහැර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රත්නපුර පාර - අවිස්සාවේල්ල පිහිටි "කොටබොඩවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. ඊ. විජේසූරිය විසින් සාදන ලද 2004 දෙසැම්බර් මස 11 දාතම හා අංක 189 දරන පිඹුරේ සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙහි ලොට් 3; නැගෙනහිරට : රත්නපුර පාර; දකුණට : ලොට් 5; බස්නාහිරට : ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම අටයි තුනක් (A.0 - R.0 - P.3.83) විශාල ඉඩම් කොටස සමග එහි පස, ගහකොළ, වගාවන් සහ ඒ මත ඇති අනෙකුත් සියලු දේ සමග එකී අංක 189 දරන පිඹුරට අනුව අංක B 553/95 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 808

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - දඹුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 3097146 සහ 3097166
කලුදේව මංජුල පර්සි ප්‍රේමලාල්

2026 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ජී. එස්. විජේසේකර විසින් 2017 සැප්තැම්බර් මස 11 වැනි දින සහතික කරන ලද අංක 2124 සහ අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. එස්. කේ. රාජපක්ෂ විසින් 2017 දෙසැම්බර් මස 26 වැනි දින සහතික කරන ලද අංක 02 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ (සහ/හෝ ඕන්මතු සඳහන් කරන උකස් බැඳුම්කරවල උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති, දඹුල්ල, කුරුණෑගල හංදියේ, අංක 622 දරන ස්ථානයේ කලුදේව මංජුල පර්සි ප්‍රේමලාල් ණයකරු හැටියට ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ නිසිලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම් ඉහත කී කලුදේව මංජුල පර්සි ප්‍රේමලාල් පැහැර හැර ඇති හෙයින්,

සහ වෙනත් කරුණු අතර, මෙහි පහත පෙන්වන පරිදි, ඉහත කී උකස් බැඳුම්කරයන් මත ණය අංක 3097146 සම්බන්ධයෙන්

මුල් මුදල සහ පොළිය සහ ණය අංක 3097166 සම්බන්ධයෙන් ගෙවිය යුතු මුල් මුදලේ කොටස වශයෙන් රුපියල් මිලියන විසි හතයි එක් ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය අසූ හයයි ශත පනස් හය (රු. 2,71,71,386.56)ක මුදලක් 2026 මැයි මස 26 වැනි දිනට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි හතයි එක් ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය අසූ හයයි ශත පනස් හය (රු. 2,71,71,386.56) ක මුදල අයකර ගැනීම සඳහා පහත විස්තර කරන ලද පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී උකස් බැඳුම්කර අංක 2124 සහ 02 මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම සහ පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) ණය අංක 3097146 සඳහා රු. 2,52,64,386.56ක මුළු මුදලක් (2026 මැයි මස 26 දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 මැයි මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,60,93,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 18% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් සහ;

(b) ණය අංක 3097166 සඳහා රු. 19,07,000.00 ක මුළු මුදලක් (2026 මැයි මස 26 දිනට රු. 65,58,000.00 ක් වන මුල් මුදලේ කොටසක්) සහ 2026 මැයි මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 19,07,000.00 ක එකී මුදල මත වර්ෂයකට 12% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර, වගපනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත සහ දඹුල්ල මහනගර සභා සීමා ඇතුළත, දඹුල්ල ගමේ පිහිටි "ගල්වැටියවත්ත සහ මූකලන්හේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් 2008 ජූලි මස 08 වැනි දින පිළියෙල කරන ලද අංක 4167 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : තම්මැන්නා ඇළ මගින් ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් පිළියෙල කරන ලද අංක 1637A දරන පිඹුරේ ලොට් 3 මගින් ද; දකුණට : පාර මගින් ද සහ බස්නාහිරට: ලොට් 01 මගින් ද මායිම් වූ එකී අංක 4167 දරන පිඹුර ප්‍රකාරව අක්කර එක (අ.1, රූ.0, පර්.0) ක *හෙවත්* හෙක්ටෙයාර් 0.4047 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ලොට් 2 පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත කී දඹුල්ල පිහිටි "මූකලන්හේන" නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට: තම්මැන්නා ඇළ සහ වැට මගින් ද; නැගෙනහිරට : තම්මැන්නා ඇළ මගින් ද; දකුණට : එම ඉඩමේ ඉතුරු කොටස මගින් ද සහ බස්නාහිරට : ගල් වැට මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාර අක්කර එක (අ.1, රූ.0, පර්.0) ක හෙවත් හෙක්ටෙයාර් 0.4047ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ආර්.ඒ.පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 ජූලි මස 28

10 - 817

මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

1961 අංක 29 දරන මහජන බැංකු පනත, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි එහි 29 ඩී වගන්තිය යටතේ වූ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ, 2026.08.31 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෙසේ ද යත්, කොළඹ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් දසනායකගේ දෝන නිමාලි අසංකා දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2023 අගෝස්තු මස 16 දිනැති අංක 4155 දරන උකස් බැඳුම්කරය යටතේ ගෙවීමට එකඟ වී ඇති මුදල් ගෙවීම, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත කරන ලද ලියාපදිංචි අංක PV 12707 දරන සහ 154/බී/3, හෝකන්දර පාර, හෝකන්දර යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන කංගරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Kangara Holdings (Private) Limited) විසින් පැහැර හැර ඇති අතර, එමෙන් ම කොළඹ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් දසනායකගේ දෝන නිමාලි අසංකා දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2025 සැප්තැම්බර් මස 10 දිනැති අංක 4621 දරන උකස් බැඳුම්කරය යටතේ ද මහජන බැංකුව වෙත ගෙවිය යුතු මුදල් ගෙවීම ද එකී ආයතනය විසින් පැහැර හැර ඇති අතර,

තව ද, එම උකස් බැඳුම්කරයන් යටතේ, 2026.07.21 දින දක්වා, මහජන බැංකුව වෙත ගෙවිය යුතු සහ හිඟව පවතින

සම්පූර්ණ මුදල රුපියල් පනස් දෙමිලියන එක් දහස් හාරසිය අනූ නවයක් සහ ශත හැත්තෑ පහක් (රු. 52,001,499.75)ක් වන අතර, එම මුදලට, මුල් ප්‍රාග්ධන මුදල ලෙස රුපියල් හතළිස් හත් මිලියන තුන්සිය අසූදහස (රු. 47,380,000.00)ක් සහ 2026.07.21 දින දක්වා එකතු වූ පොළිය ලෙස රුපියල් හතර මිලියන හයලක්ෂ විසිඑක් දහස් හාරසිය අනූ නවයක් සහ ශත හැත්තෑපහ (රු. 4,621,499.75)ක් ඇතුළත් වේ. ඉහත සඳහන් මුදලට අමතරව එම උකස් බැඳුම්කරය සඳහා 2026.07.22 දින සිට තවදුරටත් පොළිය ද ගෙවිය යුතු වේ.

1961 අංක 29 දරන මහජන බැංකු පනත, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි, එම පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලබන්නේ, ඉහත සඳහන් අංක 4155 සහ අංක 4621 දරන උකස් බැඳුම්කර මගින් මහජන බැංකුව වෙත උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය, කොළඹ බලපත්‍රලාභී වෙන්දේසිකරුවන් වන ලොකුබණ්ඩා සේනානායක, මගුරුදෙණියෙ වලව්වේ ත්‍රිවංක වරිත් සේනානායක, ගුරුගේ සුමනාවති සේනානායක සහ ධනපාල මුදියන්සේලාගේ කාලිංග නවරත්න යන මහත්ම මහත්මීන් විසින් අංක 30/83, කටුවාවෙල පාර, මහරගම සහ අංක 7/1/10, 1 වන මහල, සුපිරි වෙළෙඳසැල් සංකීර්ණය, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයන්හි පවත්වාගෙන යනු ලබන 'M/s. Thrivanka and Senanayake Auctioneers' යන නාමයෙන් ස්ථාපිත භවුල් ව්‍යාපාරය මගින් එකී භවුල් ව්‍යාපාරී ස්ථාපිත ව්‍යාපාරික ස්ථාන හරහා ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණීමට කටයුතු කළ යුතු බවයි.

එම වෙන්දේසියේ අරමුණ වන්නේ පහත සඳහන් මුදල් අයකර ගැනීමයි.

(*අ*) රුපියල් හතළිස් එක් මිලියන දෙලක්ෂ දසදහස් දෙසිය අනූවක් සහ ශත පහළොවක් (රු. 41,210,290.15) සහ එම මුදලට අමතරව, රුපියල් තිස්හත් මිලියන හයලක්ෂයක් (රු. 37,600,000.00) මත 2026.07.22 දින සිට වාර්ෂිකව 16% බැගින් තවදුරටත් අයවිය යුතු පොළිය;

සහ

(*ආ*) රුපියල් දස මිලියන හත්ලක්ෂ අනූ එක් දහස් දෙසිය නවයයි ශත හැටක් (රු. 10,791,209.60) සහ එම මුදලට අමතරව, රුපියල් නව මිලියන හත්ලක්ෂ අසූ දහසක් (රු. 9,780,000.00) මත 2026.07.22 දින සිට විකිණීම සිදුකරන දිනය දක්වා වාර්ෂිකව 18% බැගින් තවදුරටත් අයවිය යුතු පොළිය;

සහ

ඉහත සඳහන් මුදල්වලට අමතරව වෙන්දේසි කිරීමේ වියදම් ද, එමෙන් ම මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, මේ වන විට ලැබී ඇති කිසියම් ගෙවීමක් ඇත්නම් එය අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සහ මෙම දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කිරීමයි.

උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය පිළිබඳව විස්තරය

බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන ලොට් 34 දරන සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් දේපළ වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමෙන් වෙන් කරන ලද කොටසක් වන අතර එහි පෙර තක්සේරු අංක 428/34, එඩින් ගාර්ඩින්ස්, සමගි මාවත, හෝකන්දර වූ අතර වර්තමානයේ එය අංක 17, එඩින් ගාර්ඩින්ස්, පළමු මාවත, හෝකන්දර ලෙස තක්සේරු කර ඇත. මෙම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ, හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 34 ඉඩම් කොටස පහත සඳහන් සීමා මායිම්ගෙන් සමන්විත වේ. උතුරට: ලොට් 33 සහ ලොට් 29; නැගෙනහිරට : ලොට් 29; වඩාත් නිවැරදිව ලොට් 28; දකුණට : ලොට් 101 සහ බටහිරට : ලොට් 40. ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්මට අනුව, එම ඉඩම් කොටසේ ප්‍රමාණය පර්චස් දහහතයි දශම හතයි හයක් (17.76) එනම්, A:0, R:0, P:17.76 හෝ හෙක්ටයාර් 0.04492 කි. එම ඉඩම් කොටස මත පිහිටි සියලු ගොඩනැගිලි, ගස්, වගාවන් සහ වෙනත් සියලු දේ සමග මෙම ඉඩම ඇතුළත් වේ.

තව ද, පහත සඳහන් මාර්ගය ඔස්සේ සහ ඒ හරහා ගමන් කිරීමේ අයිතිය ද සමග :

1. බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන, ලොට් 100 (මීටර් 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද කොටස) ලෙස ලකුණු කර ඇති වෙන් කර හඳුනාගත් සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමට අයත් වන අතර, එම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ, හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 100 ඉඩම් කොටස පහත සඳහන් සීමාවන්ගෙන් සමන්විත වේ. උතුරට : අංක PP CO 2473 දරන සැලැස්මේ ලොට් 1; නැගෙනහිරට : ලොට් 8, ලොට් 7, ලොට් 6, ලොට් 5, ලොට් 4, ලොට් 3, ලොට් 2, ලොට් 1 සහ ලොට් 113; දකුණට: ලොට් 113; බටහිරට : ලොට් 14, ලොට් 13, ලොට් 12, ලොට් 101, ලොට් 11, ලොට් 10 සහ ලොට් 9. ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්ම අනුව, මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය රූඩ් එකයි පර්චස් නවයයි දශම එකයි එකක් එනම්, අ.0, රූ.1, පර්.9.11 හෝ හෙක්ටයාර් 0.12421 කි.

2. බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන, ලොට් 101 (මීටර් 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද කොටස) ලෙස ලකුණු කර ඇති වෙන් කර හඳුනාගත් සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමට අයත් වන අතර, එම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ, හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 101 ඉඩම් කොටස පහත සඳහන් සීමාවන්ගෙන් සමන්විත වේ. උතුරට : ලොට් 49, ලොට් 43, ලොට් 105, ලොට් 40, ලොට් 34, ලොට් 28, ලොට් 102, ලොට් 23, ලොට් 19 සහ ලොට් 11; නැගෙනහිරට : ලොට් 100; දකුණට : ලොට් 12, ලොට් 18, ලොට් 24, ලොට් 103, ලොට් 27, ලොට් 35, ලොට් 39 සහ ලොට් 104, ලොට් 44, ලොට් 48 සහ ලොට් 47; බටහිරට : ලොට් 108, ලොට් 59, ලොට් 58 සහ ලොට් 106. ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්ම අනුව, මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් පහයි දශම බිංදුවයි දෙකක්. එනම් අ.0, රූ.2, පර්. 5.02 හෝ හෙක්ටයාර් 0.21504 කි.

3. බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන, ලොට් 106 (මීටර් 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද කොටස) ලෙස ලකුණු කර ඇති වෙන් කර හඳුනාගත් සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමට අයත් වන අතර, එම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ, හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 106 ඉඩම් කොටස පහත සඳහන් සීමාවන්ගෙන් සමන්විත වේ. උතුරට : ලොට් 107, ලොට් 53, ලොට් 52 සහ ලොට් 51; නැගෙනහිරට : ලොට් 51, ලොට් 50, ලොට් 49 සහ ලොට් 101; දකුණට : ලොට් 58, ලොට් 57 සහ ලොට් 56; බටහිරට: ලොට් 56, ලොට් 55, ලොට් 54 සහ ලොට් 107. ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්ම අනුව, මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය පර්චස් විසි හතයි දශම නවයයි තුනක්. එනම්, අ.0, රූ.0, පර්. 27.93 හෝ හෙක්ටයාර 0.21504 කි.

4. බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන, ලොට් 107 (මීටර් 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද කොටස) ලෙස ලකුණු කර ඇති වෙන් කර හඳුනාගත් සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමට අයත් වන අතර, එම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ, හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 107 ඉඩම් කොටස පහත සඳහන් සීමාවන්ගෙන් සමන්විත වේ. උතුරට : PP Co 2473 දරන සැලැස්මේ ලොට් 1; නැගෙනහිරට : ලොට් 106; දකුණට : ලොට් 54, ලොට් 64, ලොට් 108, ලොට් 65 සහ ලොට් 98; බටහිරට : ලොට් 111. ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්මට අනුව, මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහහතයි දශම පහයි පහක්. එනම්, අ.0, රූ.1, පර්.17.55 හෝ හෙක්ටයාර 0.21504 කි.

5. බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන, ලොට් 108 (මීටර් 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද කොටස) ලෙස ලකුණු කර ඇති වෙන් කර හඳුනාගත් සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමට අයත් වන අතර, එම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ, හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 108 ඉඩම් කොටස පහත සඳහන් සීමාවන්ගෙන් සමන්විත වේ. උතුරට : ලොට් 107, ලොට් 64, ලොට් 63, ලොට් 62 සහ ලොට් 61; නැගෙනහිරට : ලොට් 61, ලොට් 60, ලොට් 59, ලොට් 101, ලොට් 47 සහ ලොට් 109; දකුණට : ලොට් 99, ලොට් 75, ලොට් 74, ලොට් 73, ලොට් 72 සහ ලොට් 71; බටහිරට : ලොට් 71, ලොට් 70, ලොට් 69, ලොට් 68, ලොට් 67, ලොට් 66 සහ ලොට් 65, ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්මට අනුව, මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසිහයයි දශම තුනයි එකක්, එනම්, අ.0, රූ.1, පර්. 26.31 කි.

6. බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන සකස් කරන ලද 2003.05.09 සහ අංක 1366ඒ දරන සැලැස්මේ දැක්වෙන, ලොට් 109 (මීටර් 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද කොටස) ලෙස ලකුණු කර ඇති වෙන් කර හඳුනාගත් සම්පූර්ණ ඉඩම් කොටස මෙහි සඳහන් වේ. එම ඉඩම "වැල්ලන්ගිරිය එස්ටේට්" (WELLANGIRIYA ESTATE) නම් ඉඩමට අයත් වන අතර, එම දේපළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495, වැල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ,

හෝකන්දර ප්‍රදේශයේ පිහිටා ඇත. ඉහත සඳහන් ලොට් 109 ඉඩම් කොටස පහත සඳහන් සීමාවන්ගෙන් සමන්විත වේ. උතුරට : ලොට් 47; නැගෙනහිරට : ලොට් 112, ලොට් 76, ලොට් 77, ලොට් 78, ලොට් 79 සහ ලොට් 80 වඩාත් නිවැරදිව සඳහන් කළ හොත් මාර්ගය සහ ලොට් 79 - 80; දකුණට : ලොට් 110; බටහිරට : ලොට් 83, ලොට් 84, ලොට් 85, ලොට් 99, ලොට් 110. ඉහත සඳහන් අංක 1366ඒ දරන සැලැස්මට අනුව, මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය පර්චස් තිස්නවයයි දශම එකයි අටක්, එනම්, අ.0, රූ.0, පර්.39.18කි.

මෙම ඉඩම කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 1266/103, බී 1184/92, බී1428/108, 111, බී1363/74, බී 650/135, බී 907/99 යන පත්ඉරුවල ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ නැගෙනහිර).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ නැගෙනහිර),
මහජන බැංකුව,
3 වන මහල,
අංක 177 ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

10 - 852

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.